# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.10.17 පැය 2315 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1904/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**ටී 56 වර්ගයේ ගිනි අවියක් සහ ජීව පතොරොම් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මූලාය අපරාධ විමර්ශන කොට්ඨාසය.**

2025.10.17 වන දින හුංගම පොලිස් වසමේ මාමඩල ප්‍රදේශයේදී මූලාය අපරාධ විමර්ශන කොට්ඨාසයට ලද තොරතුරකට අනුව **ටී 56 වර්ගයේ ගිනි අවියක්, එම පතොරොම් 63 ක්, උණ්ඩ ගැබ් 02 ක් සහ බෝර 12 වර්ගයේ උණ්ඩ යෙදිය හැකි අවි 02 ක්, බෝර 12 වර්ගයේ පතොරොම් 25 ක් සහ රිවොල්වර් වර්ගයේ පතොරොම් 34 ක්** සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇති අතර, සැකකරු විසින් මත්ද්‍රව්‍ය ප්‍රවාහනය සඳහා යොදාගත් බවට සැකකෙරෙන ව්‍යාජ කුටියක් සහිත ලොරි රථයක් හා කැබ් රථයක් ද පොලිස් භාරයට ගෙන ඇත. ලොරි රථය හා කැබ් රථය හුංගම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත. ගිනි අවි සහ සැකකරු වැඩිදුර විමර්ශන සඳහා මූලාය අපරාධ විමර්ශන කොට්ඨාසය භාරයේ ඇත.

**සැකකරු වයස අවුරුදු 38 ක් වන මාමඩල, හුංගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මූලාය අපරාධ විමර්ශන කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබන අතර මෙම අත්අඩංගුවට ගැනීම සම්බන්ධ වැඩිදුර වාර්තාවක් පසුව යොමු කරමි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**